**කැලණිය අධ්‍යාපන කලාපය**
**බුද්ධ ධර්මය**
**7 ශ්‍රේණිය -2016**
**දෙවන වාර පරීක්ෂණය**

පැය 1 යි විනාඩි 30යි

1 කොටස

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. බෞද්ධයාගේ අත්පොත නමින් හඳුන්වන ධම්ම පදය අයත් වන්නේ සූත්‍ර පිටකයේ,
    1) දීඝ නිකායේ යි. 2) මජ්ඣිම නිකායටය
    3) ඛුද්දක නිකායටය 4) අංගුත්තර නිකායටය

02. "අක්කොච්ඡිමං අවධිමං ....................." යන ගාථා දෙක ඇතුළත් වන්නේ.
    1) යමක වග්ගයේය 2) අප්පමාද වග්ගයේය
    3) බාල වග්ගයේය 4) පණ්ඩිත වග්ගයේය

03. ගුරු දෙගුරුන් සැර කොට - නුඹෙන් සිදුවුණු වරදට
    දඬුවමක් කළ විට - ගොසින් නොකියනු ගෙදර තරහට
මෙම කවිය ඇතුළත් වන ග්‍රන්ථයේ නම වන්නේ
    1) ගුත්තිල කාව්‍යයයි 2) සිරිත්මල්දමයි
    3) ලෝකෝපකාරයයි 4) සුභාෂිතයයි

04. සීලයෙහි 'විරතිය' හා 'සමාදානය' යනුවෙන් අංග දෙකක් වේ. විරතියට අදාළ නොවන කරුණක් වන්නේ,
    1) තමා වරදින් මිදීම 2) තමා යහපතෙහි යෙදීම
    3) අන් අය ලවා වැරදි නොකර වීම 4) වරද අනුමත නොකිරීම හා ඊට අනුබල නොදීම

05. 'අහිංසක' නම් ශිෂ්‍යයා 'අංගුලිමාල' නම් දරුණු මිනීමරුවකු බවට පත්වීමට හේතු වුයේ,
    1) සොරකම් කිරීමේ ප්‍රතිවිපාක මතය
    2) බොරුකීමේ ප්‍රතිවිපාක මතය
    3) කේලාම්කීමේ ප්‍රතිවිපාක මතය
    4) නපුරු වචන කීමේ ප්‍රතිවිපාක මතය

06. ගුරු සිසු සබඳතාව පිළිබඳව කරුණු ඇතුළත් බෞද්ධ සූත්‍රයන් වන්නේ,
    1) සිඟාලෝවාද සූත්‍රය 2) වසල සූත්‍රය
    3) රතන සූත්‍රය 4) වාසෙට්ඨ සූත්‍රය

03. 1. "අසවලා මට බැන්නේය. මට පහර දුන්නෝය. මා පරාජය කළේය. මා සතු දේ පැහැර ගත්තේය. යනුවෙන් යමෙක් නැවත නැවත නො සිතන්නේ නම් ඔහුගේ වෛරය සන්සිඳේ."
මෙම අදහස ඇතුළත් ධම්මපද ගාථාව නිවැරදිව ලියන්න.
2. මෙම ගාථාව දේශනා කිරීමට හේතු වූ සිද්ධිය කෙටියෙන් ලියන්න.
3. අවවාද නිහතමානීව පිළිගෙන පිළිපැදීම ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

04. 1. පංච සීලයෙහි හතරවෙනි හා පස්වෙනි ශික්ෂාපද දෙක ලියන්න.
2. ආජීවක අෂ්ටමක සීලය රැකීමට වචනයෙන් කරන වැරදි 4කින්ද වැළකිය යුතුය. ඉන් 3 ක් නම් කරන්න.
3. මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන අයහපත් ප්‍රතිඵල 5 ක්ලියන්න.

05. 1. සිඟාලෝවාද සූත්‍රයේ ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට ඉටු විය යුතු යුතුකම් 5 ක් දක්වා ඇත. ඉන් දෙකක් ලියන්න.
2. ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට ඔබට ගුරුවරුන්ගෙන් ලැබෙන උපකාර 3ක් ලියන්න.
3. එම උපකාර තුළින් ඔබේ ජීවිතය සාර්ථක කර ගන්නා අයුරු විස්තර කරන්න.

06. 1. 'සහජීවනය' යන වචනය ඔබේ පෙළ පොතේ අර්ථ දක්වා ඇත්තේ කෙසේද?
2. බුදුන් වහන්සේ සහජීවනයෙන් කටයුතු කිරීම අගය කළ සේක. ඔබට ද සහජීවනයෙන් කටයුතු කළ හැකි අවස්ථා 3 ක් සඳහන් කරන්න.
3. 'සහජීවනය' අගය කරමින් බුදුන් වහන්සේ ආදර්ශයෙන් ක්‍රියා කළ අවස්තාවක් කෙටියෙන් ලියන්න.

07. 1. අප බුදුන් වහන්සේ පමණ ඉවසීම අදාර්ශයෙන් පෙන් වූ උතුමෙකු මේ මිහිපිට නොමැත. බුදුන් වහන්සේගේ චරිතයෙන් එයට උදාහරණ 2 නම් කරන්න.
2. ඉවසීමෙන් ලැබෙන අනිසංස 5 ක් බුදුන් වහන්සේ දේශනා කර ඇත. ඉන් 3 ක් සඳහන් කරන්න.
3. ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවසීම ඉවහල්වන ආකාරය ලියන්න.

07. "ගුරුසිත නොරිදවා - වේලාව නොවරදවා
බැති පෙම් උපදවා- අකුරු උගනී කුමරු සොඳවා"
මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය රචනා කළේ,
1) වීදාගම මෛත්‍රී හිමියෝය
2) තොටගමුවවේ ශ්‍රී රාහුල හිමියෝය
3) කුමාරතුංග මුනිදාස මහතාය
4) එස්.මහින්ද හිමියෝය

08. අපණ්ණක ජාතකයේ සාත්තු නායක වෙළෙන්දා කාන්තාරයේ ඉදිරියේ දී වතුර නොමැති බව තිරණය කිරීමට කරුණු කීපයක් විමසා බැලුවේය. එම කරුණුවලට අදාල නොවන්නකි
1) වැසි සහිත සුළං නොහැමීම
2) විදුලි කෙටීමක් නොවීම
3) අහස ගොරවන හඬක් නොඇසීම
4) මිය ගිය සතුන්ගේ සිරුරු දැකීම

09. 'ඉවසීම' නැමති ගුණධර්මය අප බෝසතුන් ප්‍රගුණ කළ ජාතක කතාවක් වන්නේ,
1) සස ජාතකයයි
2) වෙස්සන්තර ජාතකයයි
3) ක්ෂාන්තිවාදී ජාතකයයි
4) උම්මග්ග ජාතකයයි

10. 'සුනාපරන්ත' නම් ප්‍රදේශයට ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා වැඩම කළේ,
1) පුණ්ණ හිමියන්ය
2) ආනන්ද හිමියන්ය
3) සැරියුත් හිමියන්ය
4) අනුරුද්ධ හිමියන්ය

පහත දැක්වෙන ප්‍රශ්න වල හිස්තැනට ගැලපෙන නිවැරදි පිළිතුර ලියන්න.

11. සත් සතිය ගත කරන බුදුන් වහන්සේ ධර්මය ගුරුතනතුරෙහි තබා ගත්තේ........................... වෙනි සතියේදීය.

12. ප්‍රථම ද්වේවාචික උපාසකයන් වන්නේ.................................................................ය.

13. බුදුන් වහන්සේ ගිලානෝපස්ථානයේ වටිනාකම ආදර්ශයෙන් ලොවට පෙන්නුම් කලේ........................................................................................... නම් හිමියන්ට උපස්ථාන කිරීමෙන් ය.

14. සොඳුරු බස් කියතැයි - සුන්දර තැනටසැපතැයි
.........................................................................................................................

ඉතිරි පද දෙක ලියන්න.

15. නිවන් පතන, මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු උසස් ගුණාංග 15 ක් දක්වා ඇත්තේ.......................................................................................... සූත්‍රයේය.

පහත දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් X ලකුණද වරහන් තුළ ලියන්න.

16. කෝසල රාජ්‍යයේ අගනුවර වූයේ රජගහනුවරයි ( )

17. කුඹුරු වලින් ලැබූ අස්වැන්නෙන් පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීමේ චාරිත්‍රය අග්‍රශෂ්‍ය දානය නම් වේ ( )

18. කළගුණ සැලකීමේ අගය පෙන්නුම් කරන ජාතක කතාවක් ලෙස "ගුණ ජාතකය" නම් කළ හැකිය ( )

19. "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය - මහමෙර උසුලනා මිහිකතටත් වැඩිය." මෙයින් කියවෙන්නේ "පොළොව මහමේරු පර්වතය උසුලා සිටින්නාටත් වඩා ඉවසීමෙන් අප ක්‍රියා කළ යුතු බවයි. ( )

20. වෛර කරන්නාවුනට අවෛර කිරීම
ක්‍රෝධ කරන්නවුනට අක්‍රෝධ කිරීම
අනුසෝත ගාමී ප්‍රතිපදාවයි

## 11 කොටස

පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 5 ට පිළිතුරු සපයන්න.

01. දෙවන පාසල් වාරයේ දී පාසල් පාදක ඇගයීම යටතේ ඔබ විසින් කළ ඇගයීම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. මේ සඳහා ඔබට ලැබුණු ඇගයීම කුමක්ද? (ඇගයීම් ප්‍රභේදය) ( ල 2)
2. එම ඇගයීම සඳහා ඔබට ලැබුණු ගුරු උපදෙස් 4 ක් ලියන්න (ල 4)
3. එම ඇගයීම කිරීමේදී ඔබේ පෙළ පොතේ ඔබ තෝරාගත් පාඩම් 2 ක නම් ලියන්න. (ල 2)
4. එම ඇගයීම් කිරීමේදී ඔබට මතු වූ ගැටළු 4 ක් ලියන්න. ( ල 4)
5. එම ගැටළු විසඳාගැනීමට ඔබ අනුගමනය කළ ක්‍රියාමාර්ග 2 ක් ලියන්න. (ල 2)
6. මෙම ඇගයීම් තුළින් ඔබ ලබාගත් අද්දැකීම් 4 ක් සඳහන් කරන්න. (ල4)
7. මෙම ඇගයීම කිරීමේදී විවිධ පුද්ගලයින්ගෙන් ඔබට ලැබුණු උදව් 2 ක් ලියන්න

02.
1. අනේපිඩු සිටුතුමා හා විශාඛා සිටුදේවිය විසින් කරවා සසුනට පූජා කළ ආරාම දෙක නම් කරන්න.
2. විශාඛාවට ලැබුණු උපදෙස් අතර
"ඇතුලත ගිනි පිටත නොදෙන්න."
යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
3. විශාඛාවන්ගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ 3 ක් ඇසුරෙන් යහපත් ජීවිතයක් ගොඩනගා ගත හැකි අයුරු පැහැදිලි කරන්න.